වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

10 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

Second Term Test - Grade 12 - 2020

විභාග අංකය .... සංයුක්ත ගණිතය I කාලය පැය තුනයි

උපදෙස්

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.**
  A කොටස (ප්‍රශ්න 1-10) දක්වා B කොටස (ප්‍රශ්න 11-17)
- **A කොටස**
  සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ පිළිතුරු සපයා ඇති ඉඩෙහි ලියන්න.
  වැඩිපුර ඉඩ අවශ්‍ය වේ නම් ඔබට අමතර ලියන කඩදාසි භාවිත කළ හැකිය.
- **B කොටස**
  ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- **නියමිත** කාලය අවසන් වූ පසු A කොටස B කොටසට උඩින් සිටින පරිදි කොටස් දෙක අමුණා විභාග ශාලාධිපතිට **භාර දෙන්න.**
- **ප්‍රශ්න පත්‍රයෙහි** B කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙනයාමට ඔබට අවසර ඇත.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

සංයුක්ත ගණිතය I		
කොටස	**ප්‍රශ්න අංකය**	**ලකුණු**
A	1	
	2	
	3	
	4	
	5	
	6	
	7	
	8	
	9	
	10	
B	එකතුව	
	11	
	12	
	13	
	14	
	15	
	16	
	17	
	එකතුව	
මුළු එකතුව		
ප්‍රතිශතය		

පත්‍රය I	
පත්‍රය II	
එකතුව	
අවසාන ලකුණු	

අවසාන ලකුණු

ඉලක්කමෙන්	
අකුරෙන්	

උත්තර පත්‍ර පරීක්ෂක		
පරීක්ෂා කළේ	1	
	2	
අධීක්ෂණය		

සංයුක්ත ගණිතය 12 - I (A කොටස)

01) $0 < k < 1$ නම් $(1-k)x^2 + x + k = 0$ සමීකරණයේ මූල සෑම විටම තාත්විකද සෘණ ද බව පෙන්වන්න.

....

....

....

....

....

....

....

....

....

....

....

....

02) $3-|x+1| < x^2$ අසමානතාව සපුරාලන x හි සියලු තාත්වික අගයන් සොයන්න.

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

03) $3^{2x+1} - 3^{x+4} + 3^3 = 3^x$ විසඳන්න.

04) $\lim_{x \to 0} \frac{\sin(\pi \cos^2 x)}{x^2} = \pi$ බව පෙන්වන්න.

05) $log_3\, x \;+\; log_3\, y \;=\; 3$ සහ $log_y\, x \;=\; 2$ යන සමගාමී සමීකරණ විසඳන්න.

06) x^3+ax^2+b සහ ax^3+bx^2+x-a බහුපද දෙකටම පොදු ඒකජ සාධකයක් පවතී නම් එම පොදු ඒකජ සාධකය $(b-a^2)x^2+x-a(1+b)$ බහු පදයේ ද සාධකයක් බව පෙන්වන්න.

07) $f(x) = \frac{1}{\sqrt{x+2}}$; $x \geq -2$ හා $g(x) = 2x + 1$ ලෙස අර්ථ දක්වා ඇත.

(i) $\frac{f}{g}$ ශ්‍රිතයේ වසම සොයන්න.

(ii) $\left(\frac{f}{g}\right)(0)$ හි අගය ලබා ගන්න.

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

08) $x^2 - 6ax + 2 - 2a + 9a^2 = 0$ සමීකරණයේ මූල දෙකම 3 ට වඩා විශාල නම්, $a > \frac{11}{9}$ බව පෙන්වන්න.

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

09) $\sec\theta + \tan\theta = P$ නම් $\tan\theta = \frac{P^2-1}{2P}$ බව අපෝහනය කරන්න. P යනු නිශ්ශූන්‍ය තාත්වික නියතයකි.

10) $sin^{-1}\left(\frac{5}{x}\right) + sin^{-1}\left(\frac{12}{x}\right) = \frac{\pi}{2}$ හි විසඳුම සොයන්න.

සංයුක්ත ගණිතය 12 - I (B කොටස)

<u>ප්‍රශ්න හතෙන් පහකට පමණක් පිළිතුරු සපයන්න.</u>

11) a) $f(x) = x^4 + Px^2 + r$ යැයි ගනිමු. $f(1) = -9$, $f(0) = -8$ නම්, p හා r සොයන්න. $f(x)$ යන්න $(ax^2 + b)^2 + c$ ආකාරයට ප්‍රකාශ කල හැකි නම් a, b හා c තාත්වික නියත වල අගයන් සොයන්න. මෙහි $a > 0$ වේ. ඒනයින් $f(x) = 0$ හි තාත්වික මූල සොයන්න.

b) $(p-1)x^2 - 4x + p - 1$ ප්‍රකාශණය x හි සියලු තාත්වික අගයන්ට ධන වීමට p ට තිබිය යුතු අගය පරාසය සොයන්න.

c) α, β යනු $ax^2 + bx + c = 0$ හි මූල නම් $cx^2 - 2bx + 4a = 0$ හි මූල α, β මගින් සොයන්න.

d) $\frac{x^2-1}{x^2\,(2x+1)}$ භින්න භාග වෙන් කර දක්වන්න.

12) a) $y = 2|x+1| - 3$ හා $y = x + 2\,|x-1|$ හි ප්‍රස්ථාර එකම සටහනක අඳින්න.
එනයින්,

$x + 2\,|x-1| = 2\,|x+1| - 3$ සමීකරණය විසඳන්න.

$x + 2\,|x-1| > 2\,|x+1| - 3$ අසමානතාව සපුරාලන x හි අගය කුලකය සොයන්න.

b) n ධන තාත්වික සංඛ්‍යාවක් සඳහා $a = \log_{2n} n$, $b = \log_{3n} 2n$ සහ $C\ \log_{4n} 3n$ වේ.
$1 + abc = 2bc$ බව සාධනය කරන්න.

c) $a^x = b^y = c^z = d^w$ නම්, $x\left(\frac{1}{y} + \frac{1}{z} + \frac{1}{w}\right) = \log_a \mathrm{bcd}$
බව ලබා ගන්න.

13) a) $f : \mathcal{R} \rightarrow \mathcal{R}$ ලෙස අර්ථ දැක්වෙන ශ්‍රිතය

$$f(x) = \begin{Bmatrix} -x^2 + 4\ ;\ x < 1 \\ -2x\ ;\ x \geq 1 \end{Bmatrix}$$ ලෙසගනිමු.

(i) f(x) හි දළ ප්‍රස්ථාරය අඳින්න.

(ii) $\lim_{x\to 1^-} f(x)$ හා $\lim_{x\to 1^+} f(x)$ අගයන්න.

(iii) $x = 1$ දී ශ්‍රිතය සන්තතික වේද? පැහැදිලි කරන්න.

(iv) $\lim_{x\to 1} f(x)$ පවතී නම් සොයන්න.

b) $\lim_{\theta \to o} \frac{\sin\theta}{\theta} = 1$ බව සාධනය කරන්න.

පහත සීමා සොයන්න.

(i) $\lim_{x \to 3} \frac{\sqrt{2x-1} - \sqrt{5}}{\sin(x-3)}$

(ii) $\lim_{x \to 0} \frac{\left(\sqrt{4+x^2}-2\right)(1-\cos 2x)}{x^4}$

14) a) $a, b, c \in \mathcal{R}$ ද $a \neq 0$ ද වූ $ax^2 + bx + c = 0$ සමීකරණයේ මූල තාත්වික හා ධන වීම සඳහා තෘප්ත කළ යුතු අවශ්‍යතා ලියන්න. එම අවශ්‍යතා සපිරේ නම්,

$a^2x^2 + a(3b-2c)x + (2b-c)(b-c) + ac = 0$ සමීකරණයේ මූල ද තාත්වික සහ ධන බව පෙන්වන්න. දෙවනුව දී ඇති සමීකරණයේ මූල α හා β නම් $\frac{1}{\alpha}$ හා $\frac{1}{\beta}$ මූල වන වර්ගජ සමීකරණය සුදුසු පරිණාමනයක් යෙදීමෙන් ලබා ගන්න.

b) (i) $(k, 2)$ හා $(3,4)$ ලක්ෂ්‍ය 2 ක් අතර දුර ඒකක 8 නම් k සොයන්න.

(ii) $(1,0)$, $(6,1)$, $(5,6)$ පිළිවෙලින් සමචතුරස්‍රයක ශීර්ෂ වන පරිදි ඉතිරි ශිර්ෂයේ ඛණ්ඩාංක සොයන්න.

(iii) $A(1,3)$, $B(5,3)$ ලක්ෂ්‍ය මගින් දැක්වෙන ABC ත්‍රිකෝණයේ කේන්ද්‍රකයේ ඛණ්ඩාංක $\left(\frac{10}{3}, 4\right)$ නම් C හි ඛණ්ඩාංක සොයන්න.

15) a) බහුපද පිළිබඳ සාධක ප්‍රමේයය ප්‍රකාශ කර සාධනය කරන්න.

$f(x) = x^4 + ax^3 + bx + c$ යන x හි බහුපද ශ්‍රිතය $(x-1)(x+1)(x-2)$ න් හරියටම බෙදේ නම්, a, b හා c සොයා ඉතිරි සාධකය ද සොයන්න.

$2f(x+1) = x^2 + x - 2$ සමීකරණයේ විසඳුම් සොයන්න.

b) $\frac{x^2}{(x-a)(x-b)}$ යන පරිමේය ශ්‍රිතය a හා b ඇසුරින් භින්න භාග ලෙස වෙන් කරන්න.

ඒනයින් $\frac{4x^2}{4x^2-1}$ හි භින්න භාග ලබා ගන්න.

c) $\lim_{x \to \infty} \left(\sqrt{x^2 + ax + a^2} - \sqrt{x^2 + a^2}\right)$ අගයන්න.

16) a) $\sin(A+B)$ භාවිතයෙන්, $\sin\left(\frac{5\pi}{12}\right) = \frac{\sqrt{6}+\sqrt{2}}{4}$ බව පෙන්වන්න.
ඒනයින් $\cos\left(\frac{5\pi}{6}\right) = -\frac{\sqrt{3}}{2}$ බව අපෝහනය කරන්න.

b) $\alpha + \beta - \gamma = \pi$ නම්, $sin^2\alpha + sin^2\beta - sin^2\gamma = 2\sin\alpha\sin\beta\cos\gamma$ බව සාධනය කරන්න.

c) $2\,cos^2 x + \sqrt{3}\sin x + 1 = 0$ සමීකරණයේ සාධාරණ විසඳුම සොයන්න.

d) $\tan^{-1}\left(\frac{1}{2}\right) + \tan^{-1}\left(\frac{1}{3}\right) = \frac{\pi}{4}$ බව ලබා ගන්න.

17) ABC ත්‍රිකෝණයක් සඳහා සයින් නීතිය ප්‍රකාශ කරන්න.

a) $\frac{a^2+b^2}{a^2+c^2} = \frac{1+\cos(A-B)\cos C}{1+\cos(A-C)\cos B}$ බව සාධනය කරන්න.

b) ABC ත්‍රිකෝණයේ BC පාදයේ මධ්‍ය ලක්ෂ්‍යය D වේ. සම්මත අංකනය අනුව

$AD = \frac{\sqrt{2b^2+2c^2-a^2}}{2}$ බව ද,

$B\hat{A}D = \beta$ නම්,
$\sin\beta = \frac{a\sin B}{\sqrt{2b^2+2c^2-a^2}}$ බව ද,

$A\hat{D}C = \theta$ නම්,
$\sin\theta = \frac{2b\sin C}{\sqrt{2b^2+2c^2-a^2}}$ බව ද, පෙන්වන්න.

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

10 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020
Second Term Test - Grade 12 - 2020

විභාග අංකය .... සංයුක්ත ගණිතය II කාලය පැය තුනයි

උපදෙස්

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.
  A කොටස (ප්‍රශ්න 1-10) දක්වා B කොටස (ප්‍රශ්න 11-17)
- **A කොටස**
  සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ පිළිතුරු සපයා ඇති ඉඩෙහි ලියන්න.
  වැඩිපුර ඉඩ අවශ්‍ය වේ නම් ඔබට අමතර ලියන කඩදාසි භාවිත කළ හැකිය.
- **B කොටස**
  ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- **නියමිත කාලය** අවසන් වූ පසු A කොටස B කොටසට උඩින් සිටින පරිදි කොටස් දෙක අමුණා විභාග ශාලාධිපතිට **භාර දෙන්න.**
- **ප්‍රශ්න පත්‍රයෙහි** B කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙනයාමට ඔබට අවසර ඇත.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

සංයුක්ත ගණිතය II		
කොටස	**ප්‍රශ්න අංකය**	**ලකුණු**
A	1	
	2	
	3	
	4	
	5	
	6	
	7	
	8	
	9	
	10	
B	එකතුව	
	11	
	12	
	13	
	14	
	15	
	16	
	17	
	එකතුව	
මුළු එකතුව		
ප්‍රතිශතය		

පත්‍රය I	
පත්‍රය II	
එකතුව	
අවසාන ලකුණු	

අවසාන ලකුණු

ඉලක්කමෙන්	
අකුරෙන්	

උත්තර පත්‍ර පරීක්ෂක		
පරීක්ෂා කළේ	1	
	2	
අධීක්ෂණය		

(A කොටස)

1) විශාලත්වය P හා $2P$ වන බල දෙකක සම්ප්‍රයුක්ත බලය $\sqrt{3}\,P$ වේ. එම බල දෙක අතර කෝණය සොයන්න. සම්ප්‍රයුක්ත බලය හා පළමු බලය අතර කෝණය සොයන්න.

....
....
....
....
....
....
....
....
....
....
....
....
....
....
....

2) තිරසට 30^0 ක කෝණයකින් ආනත සුමට අචල තලයක් මත ඇති ස්කන්ධය $5\,kg$ වූ ලක්ෂ්‍යයාකාර වස්තුවක් සමතුලිතව තැබීම සඳහා ආනත තලයට සමාන්තරව යෙදිය යුතු බලයේ අගය ද ආනත තලය හා වස්තුව අතර ප්‍රතික්‍රියාව ද සොයන්න.

....
....
....
....
....
....
....
....
....
....
....
....
....
....
....

3) O අචල ලක්ෂ්‍යයක් අනුබද්ධයෙන් A, B හා C ලක්ෂ්‍ය වල පිහිටුම් දෛශික පිළිවෙලින් $\underline{a}$, $\underline{b}$ හා $\underline{c}$ වේ. $3\underline{a} + 5\underline{b} = 8\underline{c}$ නම්, A, B හා C ලක්ෂ්‍ය ඒක රේඛීය වන බව පෙන්වන්න. $AC : CB$ අනුපාතය සොයන්න.

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

4) $6N$ බර අංශුවක් සැහැල්ලු තන්තු දෙකක් මගින් එල්ලෙමින් සමතුලිතව තිබේ. තන්තුවල ආතති $3N, 3\sqrt{3}\,N$ වේ නම් තන්තු දෙක සිරස සමඟ සාදන කෝණ සොයන්න.

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

....

5) අවකාශයේ වූ O ලක්ෂ්‍යයක සිට P අංශුවක් $2u$ ප්‍රවේගයෙන් සිරස්ව ඉහළට ප්‍රක්ශේපණය කරනු ලැබේ. එම මොහොතේම O ලක්ෂ්‍යයේ සිට Q අංශුවක් u ප්‍රවේගයෙන් සිරස්ව පහළට ප්‍රක්ෂේපණය කරනු ලැබේ. අංශු දෙකම ගුරුත්වය යටතේ චලිත වේ. P හා Q අංශුවල චලිත සඳහා ප්‍රවේග කාල ප්‍රස්ථාර එකම රූප සටහනක ඇඳ P අංශුව එහි උරිම උසට ළඟා වන විට Q අංශුවේ ප්‍රවේගය $3u$ වන බව පෙන්වන්න.

6) පොළොව මත වූ O ලක්ෂ්‍යයක සිය සිරස්ව ඉහළට ප්‍රක්ෂේපණය කළ අංශුවක් h සිරස් උසකින් වූ ලක්ෂ්‍යයක් පසුකර ඉහළට හා පහළට චලනය වීමට ගතවන කාලයන් t_1 හා t_2 නම්, $h = \frac{1}{2}gt_1t_2$ බව පෙන්වන්න.

7) $\underline{a}$ හා $\underline{b}$ යනු ඒකක දෛශික දෙකක් වන අතර දෛශික දෙක අතර කෝණය θ වේ. $\sin\frac{\theta}{2} = \frac{1}{2}\left|\underline{a} - \underline{b}\right|$ බව පෙන්වන්න.

8) ස්කන්ධය $4kg$ හා දිග $24m$ වූ ඒකාකාර නොවූ දණ්ඩක දෙකෙළවර A හා B වේ. එකිනෙකට $8m$ ඇතින් පිහිටි පිහි තුඩු දෙකක් මත දණ්ඩ තිරස්ව සමතුලිතව ඇත්තේ A සිට කිට්ටුම පිහිතුඩට ඇති දුර $4m$ වන සේය. දණ්ඩේ B කෙළවරින් $6N$ ක බරක් එල්ලූ විට පිහි තුඩු මගින් දණ්ඩ මත යෙදෙන ප්‍රතික්‍රියා එක හා සමාන වේ. දණ්ඩ මත ඇතිවන ප්‍රතික්‍රියාවල විශාලත්ව සොයන්න. දණ්ඩේ ගුරුත්ව කේන්ද්‍රයට A සිට ඇති දුර ද සොයන්න.

9) $-4\underline{i}+3\,\underline{j}$, $6\underline{i}-7\,\underline{j}$, $-2\underline{i}+4\,\underline{j}$ වූ බල පිළිවෙලින් $2\underline{i}-\underline{j}$, $-3\underline{i}+\underline{j}$, $4\,\underline{j}$ ලක්ෂ්‍ය වලදී ක්‍රියා කරයි. බල පද්ධතිය යුග්මයකට ඌණනය වන බව පෙන්වා යුග්මයේ විශාලත්වය සොයන්න.

10) එකම සරල රේඛීය මාර්ගයක එකිනෙක දෙසට ළඟාවන මෝටර් රථ දෙකක් v හා u ඒකාකාර ප්‍රවේගවලින් ගමන් කරයි. මෝටර් රථ දෙක අතර පරතරය d වූ විට මෝටර් රථ දෙක ගැටෙන බව වැටහීමෙන් රථ දෙකම එකම අවස්ථාවේ තිරිංග තද කිරීම හේතුවෙන් පිළිවෙලින් f_1 හා f_2 මන්දනයන් රථ දෙකට ලැබී ගැටුම යන්තමින් වළක්වා ගනී. චලිතය සඳහා ප්‍රවේග කාල ප්‍රස්ථාරය අඳින්න. $d=\frac{u^2}{2f_2}+\frac{v^2}{2f_1}$ බව පෙන්වන්න.

සංයුක්ත ගණිතය 12 - II (B කොටස)

<u>ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.</u>

11) a) $40\ kmh^{-1}$ ක ප්‍රවේගයෙන් A නම් දුම්රිය ස්ථානයක් පසු කර දුම්රියක් $7\ km$ ක දුරක් එම ප්‍රවේගයෙන්ම ගමන් කර A ට $8.5\ km$ දුරින් වූ B දුම්රිය ස්ථානයේ දී නැවැත්වීම සඳහා ඒකාකාර මන්දනයකින් ගමන් කරයි. පළමු දුම්රිය A දුම්රිය ස්ථානය පසුකරනවාත් සමඟම දෙවෙනි දුම්රියක් A සිට නිශ්චලතාවයෙන් ගමන් අරඹා ඒකාකාර ත්වරණයකින් ගමන් කර අනතුරුව ඒකාකකාර මන්දනයක් යටතේ පළමු දුම්රිය B වෙත ළඟාවනවාත් සමඟම B දුම්රියපළට ළඟා වේ.

(i) ගමන සඳහාගත වූ මුළු කාලය සොයන්න.

(ii) දෙවෙනි දුම්රිය ලබාගත් උපරිම ප්‍රවේගය සොයන්න.

b) $t = 0$ අවස්ථාවේදී නිශ්චලතාවයෙන් ආරම්භ වන x නම් මෝටර් රථයක් f ඒකාකාකර ත්වරණයකින් චලනය වේ. $t = T$ අවස්ථාවේ දී y නම් මෝටර් රථයක් එම ලක්ෂ්‍යයෙන්ම u ප්‍රවේගයෙන් ආරම්භ වී $2f$ ඒකාකාර මන්දනයක් යටතේ චලනය වේ. මෝටර් රථ යාන්තමින් එකිනෙක හමුවෙයි නම්, $2fT(u + fT) = u^2$ බව පෙන්වන්න.

12) a) දෛශික ආකලන නියමය භාවිතයෙන් $\underline{a}$ හා $\underline{b}$ දෛශික දෙකක ඓක්‍යය හා අන්තරය, අදාල සමාන්තරාස්‍රයේ විකර්ණ දෙක මගින් ලැබෙන බව පෙන්වන්න.
$\underline{a}$ හා $\underline{b}$ යනු ඒකක දෛශික දෙකක් වේ. ඒවායේ ඓක්‍යය ද ඒකක දෛශිකයක් වන පරිදි වෙයි නම් එම දෛශික දෙකේ අන්තරයේ විශාලත්වය $\sqrt{3}$ වන බව පෙන්වන්න.

b) O මූලයට සාපේක්ෂව A, B, C ලක්ෂ්‍ය තුනක පිහිටුම් දෛශික පිළිවෙලින් $4\underline{i} + 2\underline{j}$, $\underline{i} + \underline{j}$ හා $(k+1)\,\underline{i} + 6\underline{j}$ වේ. $A\hat{B}C = 45^0$ වන පරිදි $k\ (k < 0)$ හි අගය සොයන්න.

c) $OACB$ සමාන්තරාස්‍රයේ D හා E යනු පිළිවලින් $BD\!:\!DC = 1\!:\!2$ හා $AE : EC = 2\!:\!1$ වන පරිදි BC හා AC මත වන ලක්ෂ්‍ය දෙකක් වේ. F යනු OD හා BE රේඛාවල ඡේදන ලක්ෂ්‍යය වේ. O අනුබද්ධයෙන් A හා B හි පිහිටුම් දෛශික පිළිවෙලින් $\underline{a}$ හා $\underline{b}$ වෙයි. $\overrightarrow{OF} = \frac{3}{10}\left(\underline{a} + 3\underline{b}\right)$ බව පෙන්වන්න.
P හිදී OB හා CF ඡේදනය වෙයි නම් $OP\!:\!PB$ අනුපාතය සොයන්න.

13) a) OAB යනු පාදයක දිග $2a$ වන සමපාද ත්‍රිකෝණයකි. C යනු OA පාදයේ මධ්‍ය ලක්ෂ්‍ය වේ. $4P$, P සහ P යන බල පිළිවෙලින් OB, BA, AO පාද ඔස්සේ එම අක්ෂර අනුපිළිවලට ගන්නා දිශාව ඔස්සේ ක්‍රියාකරයි. OA හා OY (CB ට සමාන්තරව) පිළිවෙලින් x හා y අක්ෂ ලෙස ගෙන සෑම බලයක්ම $x\underline{i} + y\underline{j}$ ආකාරයට ප්‍රකාශ කරන්න. මෙහි $\underline{i}$ හා $\underline{j}$ යනු පිළිවෙලින් OX, OY ඔස්සේ වූ ඒකක දෛශික වේ.
එම බල පද්ධතිය $3P$ නම් තනි බලයකට ඌනනය කළ හැකි බව පෙන්වන්න.

එකී තනි බලය ත්‍රිකෝණයේ කේන්ද්‍රය ඔස්සේ ක්‍රියා කරන එකී සජාතීය සමාන්තර බලයකට හා $2\sqrt{3}\,ap$ විශාලත්වයෙන් යුත් බල යුග්මයකට ඌනනය කළ හැකි බව ද පෙන්වන්න.

b) $OABC$ ලක්ෂ්‍ය පිළිවෙලින් (0,0) (2,0) (2,1) , (0,1) වේ. P, Q, R බල පිළිවෙලින් OA, AB, BC පාද ඔස්සේ ක්‍රියා කරයි. මෙම බල පද්ධතියේ සම්ප්‍රයුක්ත බලය x+2y = 7 ඔස්සේ පිහිටයි නම්,

i) සම්ප්‍රයුක්ත බලය P ඇසුරෙන් සොයන්න.

ii) සම්ප්‍රයුක්ත බලය $x + 2y = 9$ රේඛාවට සංක්‍රමණය කරන බල යුග්මයේ ඝූර්ණය සොයන්න.

14) a) O අචල ලක්ෂ්‍යයක් අනුබද්ධයෙන් A හා B ලක්ෂ්‍ය දෙකෙහි පිහිටුම් දෛශික පිළිවෙලින් $\underline{a}$ හා $\underline{b}$ වෙයි. C හා D ලක්ෂ්‍ය පිළිවෙලින් OB හා OA මත පිහිටා ඇත්තේ $OC:CB = 5:2$ හා $OD:DA = 3:2$ වන පරිදිය. AC හා BD රේඛා E හිදී ඡේදනය වේ. $\overrightarrow{OE} = \underline{b} + \lambda\left[\frac{3}{5}\,\underline{a} - \underline{b}\right]$ ලෙස ලිවිය හැකි බව පෙන්වන්න. මෙහි λ නියතයකි.

$\overrightarrow{OE}$ සඳහා තවත් මෙවැනිම ප්‍රකාශනයක් ලබා ගන්න. එනයින් E ලක්ෂ්‍යයේ පිහිටුම් දෛශිකය $\underline{a}$ හා $\underline{b}$ ඇසුරින් සොයන්න.

b) O ලක්ෂ්‍යයක් අනුබන්ධයෙන් A, B, C ලක්ෂ්‍ය තුනක පිහිටුම් දෛශික පිළිවෙලින් $\underline{a}$, $\underline{b}$ හා $\underline{c}$ වෙයි. BC රේඛාව මත P ලක්ෂයය පිහිටා ඇති අතර $\overrightarrow{PC} = \frac{1}{10}\ \overrightarrow{BC}$ බව දී ඇත.

(i) $\overrightarrow{OP}$ දෛශිකය $\underline{a}$ හා $\underline{b}$ ඇසුරින් සොයන්න.

(ii) AP හා BC ලම්භක බව දී ඇත්නම්, $(9\underline{c} + \underline{b}).(\underline{c} - \underline{b}) = 10\underline{a}\,.(\underline{c} - \underline{b})$ බව පෙන්වන්න.

b) ඉහත ප්‍රතිඵලය භාවිතයෙන් හෝ අන් අයුරකින් OA, OB හා OC අන්‍යෝන්‍ය වශයෙන් ලම්භක වේ නම් $(3\underline{c} - \underline{b}).(3\,\underline{c} + \underline{b}) = 0$ වන බවද පෙන්වන්න.

15) a) $AB = 6a$ ද, $BC = 2\sqrt{3}\,a$ ද වන ඍජුකෝණාස්‍රයක AB , BC , CD හා DA පාදවල මධ්‍ය ලක්ෂ්‍ය පිළිවෙලින් P, Q, R හා S වේ. විශාලත්ව $15N$, $\lambda\,N$, $5N$, $10\,N$, $\mu\,N$ හා $30\sqrt{3}$ වන බල හයක්, අකුරුවල පටිපාටියෙන් දැක්වෙන දිශා ඔස්සේ පිළිවෙලින් PQ, QR, RS, SP, AD හා CD දිගේ ක්‍රියා කරයි. මෙම බල පද්ධතිය,

(i) සමතුලිත විය **නොහැකි** බවත්,

(ii) යුග්මයකට ඌණනය වේ නම්, එවිට $\lambda = -40$ සහ $\mu = 20$ බවත්,

(iii) AD දිශාවට $10\,N$ බලයකට ඌනනය වේ නම්, එවිට $\lambda = -40$ සහ $\mu = 30$ බවත් පෙන්වන්න.

b) එකිනෙකට $1m$ දුරින් එකම මට්ටමේ වූ A , B ලක්ෂ්‍ය දෙකකට $2m$ දිග තන්තුවක් සම්බන්ධ කර ඇත. තන්තුවට රිංගවා ඇති $10N$ බර සුමට මුදුවක් කෙරෙහි ක්‍රියා කරන P තිරස් බලයක් හේතුකොටගෙන එම මුදුව B ට සිරස් ලෙස යටින් සමතුලිතතව ඇත. තන්තුවේ ආතතියක් P බලයේ විශාලත්වයත් සොයන්න.

16) a) $ABCD$ සෘජුකෝණාස්‍රයේ $AB = 4cm$ හා $BC = 3m$ වේ. විශාලත්ව නිව්ටන් 8,7,3,2,8,7 බල පිළිවලින් $\overrightarrow{AB}$, $\overrightarrow{BC}$, $\overrightarrow{CD}$, $\overrightarrow{DA}$, $\overrightarrow{AC}$ හා $\overrightarrow{DB}$ පාද ඔස්සේ ක්‍රියා කරයි. R සම්ප්‍රයුක්තයේ තිරස් හා සිරස් සංරචක සොයන්න.

එනයින්, සමුප්‍රයුක්තයේ ක්‍රියා රේඛාව AB කපන ස්ථානයට A සිට දුර සොයන්න.

දැන් පද්ධතියට $9\ Nm$ වූ බල යුග්මයක් $ABCD$ අතට එකතු කරනු ලැබේ. නව සම්ප්‍රයුක්ත බලයේ ක්‍රියා රේඛාව A සිට $2m$ ක් දුරින් AB පාදය කපන බව පෙන්වන්න.

b) ලක්ෂ්‍යයක දී ක්‍රියා කරන බල තුනක සමතුලිතතාවය සඳහා ලාමි ප්‍රමේය ප්‍රකාශ කරන්න.

$ABCD$ යනු සැහැල්ලු අවිතන්‍ය තන්තුවකි. එය එකම මට්ටමේ පිහිටි A හා D යන අචල ලක්ෂ්‍ය දෙකකට ගැට ගසා ඇති අතර බර W_1 හා W_2 වූ අංශුන් පිළිවෙලින් B හා C ලක්ෂ්‍ය වලින් එල්ලා තිබේ. සමතුලිතතා පිහිටීමේ දී C ට උඩින් B තිබෙන අතර AB, BC හා CD තන්තු කොටස් සිරස සමඟ පිළිවෙලින් α, β, γ සුළු කෝණ සාදයි.

$\frac{W_1}{W_2} = \frac{\sin\gamma \ \ \sin(\beta-\alpha)}{\sin\alpha \ \ \sin(\beta+\gamma)}$ බව පෙන්වන්න.

17) a) u ආරම්භක ප්‍රවේගයෙන් චලිතය අරඹන වස්තුවක් ඒකාකාර a ත්වරණයකින් t කාලයක් ගමන් කිරීමෙන් s විස්ථාපනයක් සහිතව v අවසාන ප්‍රවේගයක් ලබා ගනී. වස්තුවේ චලිතය සඳහා වූ ප්‍රවේග ලබා ගනී. වස්තුවේ චලිතය සඳහා වූ ප්‍රවේග කාල ප්‍රස්ථාරය භාතවියෙන්,
$v = u + at$, $S = \left(\frac{u+v}{2}\right)t$, $s = ut + \frac{1}{2}at^2$ හා $v^2 = u^2 + 2as$ යන ප්‍රගතික සමීකරණ ව්‍යුත්පන්න කරන්න.

b) වස්තුවක් $u\ ms^{-1}$ ප්‍රවේගයෙන් සිරස්ව ඉහළට ප්‍රක්ෂේපණය කරනු ලැබේ. ඊට t කාලයකට පසුව එම ලක්ෂ්‍යයේම සිට එම ප්‍රවේගයෙන්ම තවත් සමාන අංශුවක් සිරස්ව ප්‍රක්ෂේපණය කරනු ලැබේ.

(i) අංශු දෙක එකිනෙක හමුවීමට ගතවන කාලය $\left(\frac{t}{2} + \frac{u}{g}\right)$බවත්,

(ii) අංශුන් හමුවන ලක්ෂ්‍යයට ආරම්භක ලක්ෂ්‍යයේ සිට ඇති සිරස් උස $\frac{4u^2 - g^2t^2}{8g}$ බවත් පෙන්වන්න.

c) ඒකාකාර කාල ප්‍රාන්තර වල දී කරාමයකින් ජල බිංදු කාන්දුවන බව නිරීක්ෂණය කරන ලදී, එක් ජල බිංදුවක් කරාමයෙන් මුදා හැරෙන මොහොතෙහි කලින් ගිළිහුණු ජල බිංදුව $\frac{1}{4}\ m$ දුරක් ඇද හැලී තිබුණි. ජල බිංදු දෙක අතර දුර $\frac{3}{4}\ m$ දක්වා වැඩිවන විට මුලින් වැටුණ ජල බිංදුවකොපමණ දුරක් පහළට ගමන් කොට තිබේද? (g = $10\ ms^{-2}$)

1) $(1-k)x^2 + x + k = 0$

Consider,

$\Delta_x = b^2 - 4ac,$

$= 1 - 4(1-k)k$ 5

$= 4k^2 - 4k + 1$

$= 4\left\{\left(k-\frac{1}{2}\right)^2 + \frac{15}{4}\right\} > 0$ 5

Roots of the eq^n α and β,

$\alpha + \beta = \frac{-1}{1-k}$

5 $= \frac{1}{k-1} < 0 \quad (\because 0 < k < 1)$

25

$\alpha\beta = \frac{k}{1-k} > 0$ 5

Therfore, eq^n has negative real roots. 5

2) $3 - |x+1| < x^2$



5 x_1

$x^2 = x+4$

$x^2 - x - 4 = 0$

$x = \frac{1 \pm \sqrt{17}}{2}$

5 $\therefore x_1 = \frac{1-\sqrt{17}}{2}$

x_2 5

$x^2 = 2 - x$

$x^2 + x - 2 = 0$

$(x+2)(x-1) = 0$

$x_2 = 1 \; ; x_2 \neq -2$

5

solution.

$x < \frac{1-\sqrt{17}}{2}$ or $x > 1$

25

5

03) $3^{2x+1} - 3^{x+4} + 3^3 = 3^x$

$3(3^x)^2 - 3^4(3^x) - 3^x + 3^3 = 0$

$3 \cdot (3^x)^2 - 82(3^x) + 27 = 0$ 5

Let $3^x = t$,

5 $3t^2 - 82t + 27 = 0$

$(t^2 - 2)(3t - 1) = 0$ 5

$t = 27$ or $t = 1/3$

$3^x = 27$, $3^x = 3^{-1}$

$\underline{\underline{x = 3}}$ 5 $\underline{\underline{x = -1}}$ 5

25

04) $\lim_{x \to 0} \dfrac{\sin(\pi \cos^2 x)}{x^2}$

$\lim_{x \to 0} \dfrac{\sin[\pi(1 - \sin^2 x)]}{x^2}$ 5

$\lim_{x \to 0} \dfrac{\sin \pi \sin^2 x}{x^2}$ 5

$\lim_{x \to 0} \dfrac{\sin \pi \sin^2 x}{\pi \sin^2 x} \times \dfrac{\pi \sin^2 x}{x^2}$ 5

$= \lim_{x \to 0} \dfrac{\sin \pi \sin^2 x}{\pi \sin^2 x} \times \pi \lim_{x \to 0} \dfrac{\sin^2 x}{x^2}$

$= 1 \times \pi \times (1)^2$ 5

$= \underline{\underline{\pi}}$ 5

25

05. $\log_3 x + \log_3 y = 3$ —— (1)

$\log_y x = 2$ —— (2)

From (1),

$\log_3 xy = 3$ 5

$xy = 27$ —— (3)

From (2);

$x = y^2$ —— (4) 5

(3) and (4), 5

$y^3 = 27$

$\underline{\underline{y = 3}}$ 5 $\quad \underline{\underline{x = 9}}$ 5

25

06. Let; $f(x) = x^3 + ax^2 + b$

$g(x) = ax^3 + bx^2 + x - a$

Let, $(x-\alpha)$, common factor of $f(x)$ and $g(x)$

$\alpha^3 + a\alpha^2 + b = 0$ —— (1) 5

$a\alpha^3 + b\alpha^2 + \alpha - a = 0$ —— (2) 5

$a \times (1) - (2) \Rightarrow$

5 $(a^2 - b)\alpha^2 - \alpha + ab + a = 0$

$(b - a^2)\alpha^2 + \alpha - a(1+b) = 0$ 5

$\Rightarrow (b-a^2)x^2 + x - a(1+b)$ has common linear factor $(x-\alpha)$. 5

25

2

07). $f(x) = \dfrac{1}{\sqrt{x+2}}$; $x \geq -2$ $\quad g(x) = 2x+1$,

(i) $\dfrac{f}{g} = \dfrac{1}{\sqrt{x+2}\,(2x+1)}$ (5)



(5)

Domain of $\dfrac{f}{g}$; $(-2, -\tfrac{1}{2}) \cup (-\tfrac{1}{2}, \infty)$ (5)

ii). $\left(\dfrac{f}{g}\right)(0) = \dfrac{1}{\sqrt{0+2}\,(2\times0+1)}$ (5) $= \dfrac{1}{\sqrt{2}}$ (5)

25

08). $x^2 - 6ax + 2 - 2a + 9a^2 = 0 \; \Big\langle \begin{matrix} \alpha \\ \beta \end{matrix}$

roots of the eq^n,

$$x = \frac{6a \pm \sqrt{36a^2 - 4(2 - 2a + 9a^2)}}{2}$$ (5)

$$x = \frac{6a \pm \sqrt{8a - 8}}{2}$$

$$= 3a \pm \sqrt{2a-2}$$ (5)

But, $\alpha, \beta > 3$ $\qquad \alpha + \beta > 6$,

$a > 1$

$\therefore \; 3a - \sqrt{2a-2} > 3$ (5)

$3(a-1) > \sqrt{2a-2}$

$9(a-1)^2 > 2a-2$

$9a^2 - 20a + 11 > 0$

(5) $(9a-11)(a+1) > 0$

$(9a-11) > 0$

$a > 11/9$ (5)

25

9. $\sec\alpha + \tan\alpha = p$

5 $\tan\alpha = p - \sec\alpha$

$\Longrightarrow \tan^2\alpha = (p - \sec\alpha)^2$ 5

$(\tan\alpha - p)^2 = 1 + \tan^2\alpha$ 5

5

$\cancel{\tan^2\alpha} - 2p\tan\alpha + p^2 = 1 + \cancel{\tan^2\alpha}$

$\tan\alpha = \dfrac{p^2 - 1}{2p}$ 5

25

10. $\sin^{-1}\left(\frac{5}{x}\right) + \sin^{-1}\left(\frac{12}{x}\right) = \frac{\pi}{2}$

Let,

$\alpha = \sin^{-1}\left(\frac{5}{x}\right)$, $\beta = \sin^{-1}\left(\frac{12}{x}\right)$, γ

5

$\sin\alpha = \frac{5}{x}$ $\sin\beta = \frac{12}{x}$



Then, $\alpha + \beta = \frac{\pi}{2}$

$\alpha = \frac{\pi}{2} - \beta$ 5

$\sin\alpha = \sin\left(\frac{\pi}{2} - \beta\right)$

$\sin\alpha = \cos\beta$ 5

$\frac{5}{x} = \frac{\sqrt{x^2 - 144}}{x}$; $x \neq 0$,

25

$x^2 - 144 = 25$ $x = \pm 13$ $(\alpha, \beta < \pi/2)$

5

solution $x = 13$ 5

3

PART - B

(11). a). $f(x) = x^4 + px^2 + r$; $f(1) = -9$, $f(0) = -8$

$f(1) = 1 + p + r = -9$

$f(0) = \underline{\underline{r = -8}}$ (5)

$\underline{\underline{p = -2}}$ (5)

$$x^4 - 2x^2 - 8 \equiv (ax^2+b)^2 + c$$

$$= a^2x^4 + 2abx^2 + b^2 + c$$

Equating coefficients

$(a > 0)$

$x^4 \longrightarrow \quad 1 = a^2$ — (1)

$x^2 \longrightarrow \quad 0 = 2ab$

$ab = -1$ — (2) (10)

$-8 = b^2 + c$ — (3)

(5) $\underline{a=1}$ $\quad \underline{\underline{b = -1}}$ (5) $\quad \underline{\underline{c = -9}}$ (5)

$$\therefore f(x) = (x^2-1)^2 - 9$$

$$= (x^2-1)^2 - 3^2 \quad (5)$$

$$= (x^2-1-3)(x^2-1+3)$$

$$= (x^2-4)(x^2+2) \quad (5)$$

$$= (x-2)(x+2)(x^2+2)$$

55

Hence; real roots of the eq^n $\underline{\underline{x = 2}}$ $\underline{\underline{x = -2}}$ (5) (5)

11

b). Let $h(x) = (p-1)x^2 - 4x + p - 1$

$\forall\, x \in \mathbb{R}, \quad h(x) > 0;$

$(p-1) > 0$ 5 and $\Delta x < 0$ 5

$\Delta x = 16 - 4(p-1)(p-1) < 0$

$4 - (p-1)^2 < 0$ 5

$(2-p+1)(2+p-1) < 0$

5 $(3-p)(p+1) < 0$

30



5

Then,



$\therefore \quad p > 3$ 5

c). $ax^2+bx+c=0 \left\langle \begin{matrix} \alpha \\ \beta \end{matrix} \right.$ 5 $\quad \alpha+\beta = -b/a$, $\quad \alpha\beta = c/a$

$cx^2 - 2bx + 4a = 0 \left\langle \begin{matrix} \lambda \\ \mu \end{matrix} \right.$.

$$x = \frac{2b \pm \sqrt{4b^2 - 4.c.4a}}{2c} = \frac{b \pm \sqrt{b^2 - 4ac}}{c}$$ 5

$$x = \frac{b}{c} \pm \sqrt{\frac{b^2}{c^2} - 4\frac{a}{c}}$$

$$= -\left(\frac{\alpha+\beta}{\alpha\beta}\right) \pm \sqrt{\left(\frac{\alpha+\beta}{\alpha\beta}\right)^2 - \frac{4}{\alpha\beta}} \quad (10)$$

$$= -\left(\frac{\alpha+\beta}{\alpha\beta}\right) \pm \sqrt{\frac{(\alpha+\beta)^2 - 4\alpha\beta}{\alpha\beta}} \quad (5)$$

$$= -\left(\frac{\alpha+\beta}{\alpha\beta}\right) \pm \left(\frac{\alpha-\beta}{\alpha\beta}\right)$$

(5)

$$\therefore \lambda = -\left(\frac{\alpha+\beta}{\alpha\beta}\right) + \left(\frac{\alpha-\beta}{\alpha\beta}\right)$$

$$\lambda = \frac{-2}{\alpha} \quad (5)$$

$$\mu = \frac{-2}{\beta} \quad (5)$$

40

d). $$\frac{x^2-1}{x^2(2x+1)} = \frac{A}{x} + \frac{B}{x^2} + \frac{C}{(2x+1)} \quad (10)$$

$$x^2-1 = Ax(2x+1) + B(2x+1) + Cx^2$$

$x = -\frac{1}{2}$ $\quad \frac{1}{4} - 1 = \frac{C}{4}$ $\qquad$ $x = 0$ $\quad -1 = B$ (5)

(5) $C = -3$

$x = 1$ $\quad 0 = A(3) - 1(3) - 3 \qquad A = 2$

25

$$\therefore \frac{x^2-1}{x^2(2x+1)} = \frac{2}{x} - \frac{1}{x^2} - \frac{3}{(2x+1)} \quad (5)$$

12. a). $y = 2|x+1| - 3$ $\qquad\qquad$ $y = x + 2|x-1|$

$$y = \begin{cases} 2(x+1)-3 \;;\; x \geq -1 \\ 2x-1 \\ -2(x+1)-3 \;;\; x<-1 \\ -2x-5 \end{cases} \quad 5 \qquad\qquad y = \begin{cases} x+2(x-1) \;;\; x \geq 1 \\ 3x-2 \\ x-2(x-1) \;;\; x<1 \\ -x+2 \end{cases} \quad 5$$



Let,

$x + 2|x-1| = 2|x+1| - 3$;

$\underline{\underline{x = 1}}$ 5 $\qquad$ $-x+2 = -2x-5$

$\underline{x = -7}$ 5

Let,

$x + 2|x-1| > 2|x+1| - 3$;

5 $\underline{x > -7}$; $x \neq 1$ 5

50

5

b). $a = \log_{2n} n \qquad b = \log_{3n} 2n \qquad c = \log_{4n} 3n$

Considering;

$1+abc = 1 + \log_{2n} n \cdot \log_{3n} 2n \, \log_{4n} 3n$ (5)

$= 1 + \dfrac{\log n}{\cancel{\log 2n}} \times \dfrac{\cancel{\log 2n}}{\cancel{\log 3n}} \times \dfrac{\cancel{\log 3n}}{\log 4n}$ (10)

$= 1 + \dfrac{\log n}{\log 4n}$ (5)

$= 1 + \log_{4n} n$

$= \log_{4n} 4n + \log_{4n} n$ (5)

$= \log_{4n} 4n^2$ (5) $= \log_{4n} (2n)^2$ (5)

$= 2 \log_{4n} 2n$ (5)

$= 2 \log_{3n} 2n \times \log_{4n} 3n$ (5)

$\underline{\underline{1+abc = 2bc}}$ (5)

50

12)

e) $a^x = b^y = c^z = d^w = t$ (5) + (5)

$x\left(\frac{1}{y}+\frac{1}{z}+\frac{1}{w}\right) = \log_a bcd$

Considering;

$x\left(\frac{1}{y}+\frac{1}{z}+\frac{1}{w}\right)$

$= \log_a t \left(\frac{1}{\log_b t} + \frac{1}{\log_c t} + \frac{1}{\log_d t}\right)$ (10)

(5)

$= \log_a t \; \log_t (bcd)$ (10)

$= \cancel{\log_a t} \; \dfrac{\log_a bcd}{\cancel{\log_a t}}$ (10)

$= \log_a bcd$

(5)

$\therefore \; x\left(\frac{1}{y}+\frac{1}{z}+\frac{1}{w}\right) = \log_a bcd$

50

6

13) $f: \mathbb{R} \longrightarrow \mathbb{R}$

$$f(x) = \begin{cases} -x^2+4 \; ; & x<1 \\ -2x \; ; & x \geq 1 \end{cases}$$

i)



20

ii). $\lim\limits_{x \to 1^-} f(x) = 3$ 5 $\qquad \lim\limits_{x \to 1^+} f(x) = -2$ 5

iii). $\lim\limits_{x \to 1^-} f(x) \neq \lim\limits_{x \to 1^+} f(x)$ 10

5

Therfore, not continuous at the point $x=1$.

iv). $\lim\limits_{x \to 1} f(x)$, does not exist. 10

55

b). $\lim_{a \to 0} \frac{\sin a}{a} = 1$ To proof 40

I). $\lim_{x \to 3} \frac{\sqrt{2x-1} - \sqrt{5}}{\sin(x-3)}$

$= \lim_{x \to 3} \frac{(2x-1-5)}{\sin(x-3)\left(\sqrt{2x-1} + \sqrt{5}\right)}$ 5

$= \lim_{x \to 3} \frac{2(x-3)}{\sin(x-3)\left(\sqrt{2x-1} + \sqrt{5}\right)}$

$= 2 \lim_{x \to 3} \frac{(x-3)}{\sin(x-3)}$ 5 $\lim_{x \to 3} \frac{1}{\left(\sqrt{2x-1} + \sqrt{5}\right)}$

5

$= 2 \times 1 \times \frac{1}{2\sqrt{5}}$ 5

$= \frac{1}{\sqrt{5}}$ 5 25

ii). $\lim_{x \to 0} \dfrac{\left(\sqrt{4+x^2}-2\right)\left(1-\cos 2x\right)}{x^4}$

$= \lim_{x \to 0}$ (5) $\dfrac{(4+x^2-2)}{\left(\sqrt{4+x^2}+2\right)} \quad \dfrac{2\sin^2 x}{x^4}$ (5)

$= 2 \lim_{x \to 0} \left(\dfrac{\sin^2 x}{x^2}\right)$ (5) $\lim_{x \to 0} \dfrac{1}{\left(\sqrt{4+x^2}+2\right)}$ (5)

$= 2 \times (1)^2 \times \dfrac{1}{4}$ (5)

$= \dfrac{1}{2}$ (5)

30

14). (a). $ax^2+bx+c=0 < \begin{matrix}\alpha \\ \beta\end{matrix}$

For positive real roots,

$\Delta x = b^2-4ac \geqslant 0$

$\alpha+\beta > 0$

$\alpha\beta > 0$ (15)

$a^2x^2+a(3b-2c)x+(2b-c)(b-c)+ac=0$

$\Delta x = b^2-4ac \geqslant 0$, — (1) (5)

$\alpha+\beta = -b/a > 0$ — (2) (5) $\alpha\beta = c/a > 0$ — (3) (5)

$$a^2x^2 + a(3b-2c)x + (2b-c)(b-c) + ac = 0 < {}^{\lambda}_{\mu} \quad \text{— (A)}$$

$$\Delta_x = a^2(3b-2c)^2 - 4a^2\{(2b-c)(b-c) + ac\} \quad (10)$$

$$= a^2\{9b^2 - 12bc + 4c^2 - 4(2b^2 - 3bc + c^2 + ac)\}$$

$$= a^2\{b^2 - 4ac\} \geqslant 0 \quad (5) \quad (\text{From } (1))$$

$$\lambda + \mu = \frac{a(2c-3b)}{a^2}$$

$$= \frac{(2c-3b)}{a} \quad (10)$$

$$= 2\left(\frac{c}{a}\right) - 3\left(\frac{b}{a}\right) > 0 \quad ((2) \text{ and } (3))$$

$$\lambda\mu = \frac{(2b-c)(b-c) + ac}{a^2} \quad (5)$$

$$= \frac{2b^2 - 3bc + c^2 + ac}{a^2} \quad (5)$$

$$= 2\left(\frac{b}{a}\right)^2 - 3\underset{(-)}{\left(\frac{b}{a}\right)}\underset{(+)}{\left(\frac{c}{a}\right)} + \left(\frac{c}{a}\right)^2 + \underset{(+)}{\left(\frac{c}{a}\right)} > 0 \quad (5)$$

Therfore, eq^n (A) has positive (5) real roots. 75

Let, $\frac{1}{\lambda} = y$ (5)

λ, root of (A),

Then, $\frac{1}{x} = y \implies$ (5) $x = \frac{1}{y}$

substituting, $x = \frac{1}{y}$ into (A) $\Rightarrow$

$$a^2\left(\frac{1}{y}\right)^2 + a(3b-2c)\left(\frac{1}{y}\right) + (2b-c)(b-c) + ac = 0$$

(5)

$$\left[(2b-c)(b-c) + ac\right]y^2 + a(3b-2c)y + a^2 = 0$$

$$\underline{\underline{(2b^2-3bc+c^2+ac)y^2 + a(3b-2c)y + a^2 = 0}}$$ (5) 20

b). (i) $A(k,2)$ and $B(3,4)$

$$AB = (k-3)^2 + (4-2)^2 = 64$$

$$(k-3)^2 + 4 = 64$$

$$(k-3)^2 = 60$$

$$k-3 = \pm 2\sqrt{15}$$

$$\underline{\underline{k = 3 \pm 2\sqrt{15}}}$$ (15)

ii).



$O \equiv (3,3)$

$$3 = \frac{x_0+6}{2}, \quad 3 = \frac{y_0+1}{2}$$

$$x_0 = 0, \quad y_0 = 5$$

$$\therefore \underline{\underline{D \equiv (0,5)}}$$ (15)

$$\frac{4x^2}{(4x^2-1)} = \frac{(2x)^2}{(2x-1)(2x+1)}$$

$x \longrightarrow 2x$

